## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2026.03.11 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීම 2026 මාර්තු මස 11 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.නිර්මික දීපාල් අබේවර්ධන මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.චන්ද්‍රලාල් මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමා. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ඉන්දික කුමාර මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.සුලාරි සඳරේඛා මාකාවිට මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඉන්දික උදයකුමාර ගුණවර්ධන මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ටී. ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එම්.ප්‍රදීපා ඉඳුමිණී කුලරත්න මැතිතුමිය. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | වෙරංජා කාමනී විජේරත්න මැතිතුමිය. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩබ්.මොහාන් මංජුල මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.තිෂෝක් මැතිතුමා |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ධනේශ් කුමරන් මැතිතුමා |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | බී.තුෂාරි දමයන්ති සිල්වා මැතිතුමිය |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | එච්.ඥානලතා හපුතන්ත්‍රී මැතිතුමිය |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමා |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඩබ්.එම්. ශ්‍රියානි වීරසේකර මැතිතුමිය |

පැමිණ සිටි සියලු දෙනාම ආගම සිහි කර , ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු විපක්ෂ නායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද, ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01.2026.02.11 මහා සභා වාර්තාව / 2026.02.27 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

2026.02.11 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව හා 2026.02.27 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය පෙ.ව.10.30ට සභාවෙන් පිටවන ලදි.

**02. සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

හදිසි යෝජනා ලෙස ඉදිරිපත් කර ඇති යෝජනා හදිසි ස්වාභාවයේ යෝජනා නොවන බවත්,විධිමත් න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ යෝජනාවන් පිළිබඳව සභා අනුමැතිය ලබා ගැනීමේදී අංක 2463/63 හා 2025.05.30 දිනැති ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රාදේශීය සභා රීති 20 වගන්තියේ 13 සහ 14 උප වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා එවා ඇති 2026.02.23 දිනැති අංක ACLG 06/01/10/03 ලිපිය ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරමින් සියලුම යෝජනා විධිමත් ලෙස න්‍යාය පත්‍රයට ඇළත් කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

ඉදිරි කාලයේදී ශ්‍රී ලංකාවට බලපැවැත්වීමට නියමිත නිරිත දිග මෝසම් වර්ෂාවේදී අප සභා බල ප්‍රදේශයේ ස්වාභාවික විපත් ඇතිවිය හැකි ස්ථාන හා මාර්ගවලට හානිවන ලෙස පිහිටා ඇති අනතුරුදායක ගස් සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කරන ලෙසට පළාත් පාලන කොමසාරිස් විසින් උපදෙස් ලබා දී ඇති බවත්,එකී වාර්තාව සකස් කිරීම සඳහා ඔබ කොට්ඨාශයේ හදුනාගත් මාර්ග හා අනතුරුදායක ගස් පිළිබඳ තොරතුරු විෂය නිළධාරී වෙත ලබා දෙන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි

**03.සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා.**

හදිසි ශල්‍යය කර්මයකට ලක්වීම හේතුවෙන් වෛද්‍යය හේතුන් මත සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා උප සභාපති එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සභාවට එන අතරතුර හදිසි අනතුරකට මුහුණපෑම හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**04.ගරු සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම- නැත**

**05.යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න -නැත**

**06.යථා පරිදී කල් දී ඇති යෝජනා**

**I.ගරු සභාපති එම්.ජී.ඒ. ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01. 2026 අවුරුදු උදාවත් සමඟ දින 06ක් පුරා අලුත් අවුරුද්ද වෙනුවෙන් සිදු කරන ප්‍රවර්ධන වැඩසටහන සඳහා අපි මිණිපුර මාධ්‍ය සංගමය හා පුල්සර චමත් යන දෙදෙනා ඉදිරිපත් වූ බැවින් මේ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනිම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.(මේ සඳහා එක් දිනකට රු.5000.00 ක මුදලක් සමඟ මුද්දර ගාස්තු රු.500.00ක මුදලක් සමඟ අය කළ යුතු බව 2026 වාර්ෂික ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

වෙළඳ සංගමය නිරන්තරයෙන් ප්‍රාදේශීය සභාවට සහය දක්වන හෙයින් පුල්සර චමත් වෙත ලබා දීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ඉල්ලුම් කරුවන් දෙදෙනෙකු ඉදිරිපත් වී ඇති බැවින් මෙම ඉල්ලුම්කරුවන්ට ලබා දීමේදී කිසියම් පදනමක් තිබේද යන්න සළකා බැලිය යුතු බවත්,දෙදෙනෙකුගෙන් එක් අයෙකුට ලබා දීම සම්බන්ධයෙන් සභාව තීරණය කර එක් අයෙකුට ලබා දීම සම්බන්ධයෙන් ඇති හැකියාව කුමක්ද යන්න සැළකිලිමත් විය යුතු බවත්,විගණනයකට ලක්වේද යන්න සොයා බැලිය යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

සභාවට බදු ගෙවන අනුග්‍රහය දක්වන පිරිසකට දීමට හැකියාවක් පවතින බවත් ,ලාභය සළකා බලා වෙළඳ සංගමයට අවාසියක් සිදු කිරීම හොඳ නැති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

වර්තමාන නීතිමය තත්වය අනුව සභාවට උදව් කළ පමණින් තීන්දු තීරණ ගැනීමේ ගැටළුකාරී තත්වයක් පවතින බවත්,එහෙයින් ටෙන්ඩර් පටිපාටියට යාම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

මෙවැනි කටයුත්තකදී විවෘත තරඟයකය යෑම සුදුසු බව ලේකම්තුමන් අදහස් දැක්වූ බවත්, මෙවැනි කණ්ඩායම් දෙකක්

කොමසාරිස් අමතා ලබා ගන්නා ලද බවත්,මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය සභාව සතු බවත්,ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 01**

2026 අවුරුදු උදාවත් සමඟ දින 06ක් පුරා අලුත් අවුරුද්ද වෙනුවෙන් සිදු කරන ප්‍රවර්ධන වැඩසටහන සඳහා පුල්සර චමත් මයා වෙත ලබා දීමටත් 2026 වාර්ෂික ගැසට් පත්‍රයේ සඳහන් ආකාරයට අදාළ මුදල් අය කර ගැනීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

02.2025 08.20 වන දින මහා සභා තීරණ අංක 07 යටතේ මාගේ පෞද්ගලික ලේකම් ලෙස වැඩභාරගත් පී.ජී.ආර්.මනෝජ් චන්දික මහතා ලේකම් ධූරයෙන් ඉල්ලා අස්වූයෙන් නව ලේකම් ධූරය සඳහා අංක 38,ඊරියන්දළුව, පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි කොතලාවලගේ පාලිත පියරත්න මහතා පත් කිරීමටත් ප.පා.කො.චක්‍රෙල්ඛ CLG/LG/2/16/2019 ප්‍රකාරව රු.15,000.00ක මුදල ගෙවීමටත්,එම මුදලින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට අදාළ දායක මුදල් අය කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

නමුත් විධිමත් ක්‍රමවේදයකින් තොරව ලේකම් ධූරය සඳහා නම් යෝජනා කර ඇති බවත්,ගරු සභාපතිතුමාගේ අභිමතය පරිදි තෝරාගෙන ඇති බවත්,ඒ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවත්,නමුත් විධිමත් ක්‍රමවේදයකට නැති හෙයින් අපගේ කණ්ඩායමේ අනුමත කිරීමකින් තොරව ඔබතුමන්ලාගෙන් අනුමත කරගන්නා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 02**

නව සභාපති ලේකම් ලෙස අංක 38,ඊරියන්දළුව, පැල්මඩුල්ල ලිපිනයෙහි පදිංචි කොතලාවලගේ පාලිත පියරත්න මහතා පත් කිරීමටත් ප.පා.කො.චක්‍රෙල්ඛ CLG/LG/2/16/2019 ප්‍රකාරව රු.15,000.00ක මුදල ගෙවීමටත්,එම මුදලින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට අදාළ දායක මුදල් අය කිරීමත් සුදුසු බව සභා සම්මත විය.

03.නොසැසඳුන ලේඛන වල වෙනස් වීම් සෙවීම සඳහා කමිටුවක් පත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.පුෂ්පකුමාර මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම කමිටුව සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම් මංජුල දසනායක මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඉන්දික උදයකුමාර මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.සුලාරි සඳරේඛා මැතිතුමිය සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 03**

නොසැසඳුන ලේඛන වල වෙනස් වීම් සෙවීම සඳහා පහත නම් සඳහන් සමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | - | ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම් මංජුල දසනායක මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදයකුමාර මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.සුලාරි සඳරේඛා මැතිතුමිය

04.පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රධානය යටතේ 2025.11.12 වන දින මහා සභා තීරණ අංක 03 යටතේ ගල්ලෙපිට ආදාහනාගාරය පිහිටි භූමියෙහි අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදි කිරීම සුදුසු බවට තීරණය කරන ලදි.2026 වර්ෂයේදී එම යෝජනාව වෙනුවට ,

- පැල්මඩුල්ල සතිපොළ ආශ්‍රිත රථගාල සංවර්ධනය කිරීම.
- පාරිභෝගික ජනතාවට එකම ස්ථානයකදී පහසුවෙන් තමන්ට අවශ්‍ය සියලුම සේවාවන් ලබා ගැනීමට හැකි වෙළඳ සංකීර්ණයක් ස්ථාපිත කිරීම.

සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ සුමේධ ලක්මාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ආදාහනාගාරය ඉදිරිපිට පෞද්ගලික අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදිවෙමින් පවතින බවත්,එම ස්ථානයේම සභාව විසින් අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදිකිරීම සිදු නොකිරීම මාගේ අදහස බවත්,ඒ වෙනුවට විකල්ප යෝජනා 02ක් ඉදිරිපත් කරන බවත්, පැල්මඩුල්ල සතිපොළ ආශ්‍රිත රථගාල සංවර්ධනය කිරීම සඳහා ලක්ෂ 150ක මුදලක් ඉල්ලා ඇති බවත්,සතිපොළ භූමිය ගල් අතුරා සම්පූර්ණ ආරක්ෂිතව සකස් කිරීමටත්, SLT එක ළඟ සිට ගන්කන්ද හංදිය දක්වාත් එතැන් සතිපොළ දක්වාත් කඩ කාමර 10ක් පහළ තට්ටුව හැටියටත්, කඩ කාමර 10ක් ඉහළ තට්ටුව හැටියටත්,කඩ කාර 20ක් ඉදි කිරීමට යෝජනාවක් ඉදිරිපත් කරන බවත්,ඒ සඳහා ලක්ෂ 260 ක වියදමක් යන බවත්, ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

පෞද්ගලික උත්සව ශාලාවල් වෙන් කිරීමේදී ජනතාවට විශාල මුදලක් දැරීමට සිදු වන බවත්,උපතේ සිට මරණය දක්වාම වගකීම සභාවට බැවින් එම ස්ථානයේ අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදිකිරීමට සුදුසුම සභාව බවත්,මෙවැනි අවස්ථා වලදී සභාවක් ලෙස පසුපසට අඩිය තිබ්බ තැන් කිහපයක් තිබූ බවත්ය.හෙළ බොජුන් හළ ඉදි කිරීමට සූදානම් වූ අවස්ථාවේ පෞද්ගලික හිමිකරුවෙකු එම බොජුන් හළ ඉදි කිරීම තුලින් එය නැවතීමට සුදු වුව බවත්,මෙම අවමංගල්‍ය උත්සව ශාලාව ඉදි කිරීමට මුදල් වෙන් වී ඇති අවස්ථාවේ පෞද්ගලික උත්සව ශාලාවක් ඉදි කරනවා කියල අඩියක් පස්සට තිබ්බොත් පැල්මඩුල්ල කොට්ඨාශය තුළ ජීවත්වන අහිංසක ජනතාවට කරන අසාධාරණයක් බවත්ය.ආදාහනාගාර භූමියේ පෞද්ගලික උත්සව ශාලාවක් ඉදිකළහොත් අඩු වියදමට ජනතාවට සහනය ලබා දිය හැකි බවත්ය.විකල්ප මාර්ගවලට යාම හරි බවත්,නමුත් මෙම ස්ථානයේ පෞද්ගලික උත්සව ශාලාවක් ඉදි කිරීම සුදුසු බවත්,සභාවේ මන්ත්‍රීවරයෙකුගේ ළඟම ඥාතියෙකුගේ අවමංගල්‍යයකදී සහන සැළසීම සඳහා සුභසාධන ක්‍රමයක් ඇතුළත් කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

පැල්මඩුල්ල තාවකාලික පැලැස්තර නොමැතිව හරියාකාරව දියුණු කළ යුතු බවත්,මෙසේ දියුණු කිරීමට නාගරික සංවර්ධන සැලැස්මක් සාදා තිබෙන බවත්,සැවොම එකතු වී මෙම සැලැස්ම සකසා ඇති බවත්ය,මෙය පියවරෙන පියවර සිදු කළ යුතු බවත්,පැල්මඩුල්ල සතිපොළ අසළ ටෙලිකොම් එක අයින් කර ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති බවත්,මෙම ස්ථානයේ ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කිරීම සුදුසු බවය.මෙම ස්ථානයේ මීට පෙර වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට භූමිය පරීක්ෂා කළ බවත්, ලක්ෂ 50ක් පමණ වියදම් කර මහ ඇමතිතුමාගේ අධීක්ෂණය යටතේ මෙම කාර්යය සිදු කිරීමේදී මෙම භූමියේ දෝනා ගමන් කොට ඇති බැවින් වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීම සුදුසු නැති බවත් නිරීක්ෂණය වූයෙන් නාගරික සංවර්ධන සැළැස්මට බස්නැවතුම්පළ පිටුපස ඉඩමෙහි වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට යෝජිත බවත්,මෙම පිට්ටනියට අධිකරණ කටයුත්තක් යන බවත්,එයට කුමක් වූවාද යන්න නොදන්නා බවත්,පැල්මඩුල්ල නගරය දියුණු කරනවානම් RDA, නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතන එකතු වී මෙම යෝජනා පිළිබඳව පොදු එකඟතාවය මත ක්‍රියාත්මක කළ යුතු බවය.මුදල් ලබා දුන්නත් අධිකරණ කටයුත්තක් ඇත්නම් මෙම කටයුත්ත සිදු කිරීමට හැකියාවක් නැත.පෞද්ගලිකව කවුරු අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදි කරත්,අපිත් සභාවක් හැටියට ආදාහනාගාර උත්සව ශාලාවක් ඉදි කළ යුතුය.එවිට ජනතාවට සේවයක් සැළසිය හැකිය.මෙම හැම සංවර්ධනයක්ම අපි කරමු.කිසියම් සංවර්ධනයක් සිදු කරන විට සියලු ආයතන දැනුවත් කරන Link එකක් හදමු.එවැනි දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් සැකසිය යුතු බවත්,නාගරික සංවර්ධන සැලැස්මට අනුකූලව නගරය දියුණු කිරීමට අද පුළුවන් දේ අද සිදු කිරීමටත්,විධිමත් සැලැස්මකට අනුව මෙම සංවර්ධනයන් සිදු කිරීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව නාගරික සංවර්ධන සැලැස්මට අනුව ගෙන ආ බවත්,නගර සැලසුමට අනුව මෙම ස්ථානය රථ ගාලකට

වෙන්වූ තැනක් බවත්,රථ ගාලෙහි ආදායම ලබා ගැනීමට ක්‍රමයක් නොමැති බවත් ඒ සම්බන්ධයෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවෙහි සාකච්ඡා වූ බවත්,පාලර් එකක් නඩත්තු කරන්නේ කෙසේද යන්නත්, පාලර් 02ක තිබුණොත් එහි ඵලදායිතාවට ගැටළුකාරී බවත්,මෙම යෝජනාව අපට ලැබෙන මුදල් භාවිතා කර ආදායම් උත්පාදනය කිරීමටත්,නගර සැලසුමට අනුව පොළ භූමිය,කඩ කාමර,රථ ගාල සංවර්ධනය කිරීමටත්,භූමිය සම්බන්ධයෙන් නීතිමය ගැටළුවක් පවතීනම් එය පිළිගත යුතු බවත්,මෙම යෝජනාව මෙම මොහොතේ ඵලදායි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

සභාවට ආදායම ලැබෙනවානම් යහපත් ව්‍යාපෘතියක් සිදු කිරීම ගැටළුවක් නොමැති බවත්,පැල්මඩුල්ල නගරයට ප්‍රධාන පාරේ ක්‍රීඩා පිටියක් කියල තිබුනෙ මෙම භූමිය බවත්,කඩ කාමර ටිකක් ගහල ඉදිකිරීමක් සිදු කළහොත් ඇහිරීමක් සිදු විය හැක.දැනටම එම භූමියෙහි ටෙලිකොම් ආයතනය පිහිටා ඇති බවත්,එහි නීතිමය පැතිකඩ නොදන්නා බවත්,මෙම භූමිය නිදහස් කරගෙන ක්‍රීඩා පිටියක් ලෙස නවීකරණය කර තබා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

තරඟකාරීත්වය සමඟ අපිත් ඉදිරියට ගොස් අප අවමංගල්‍ය උත්සව ශාලාවක් හදමු.ඉන් අනතුරුව සුභ සාධනවාදී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටත්,මෙම ඉඩම වටිනා ඉඩමක් බැවින් එතනින් ආදායමක් ලබා ගත හැකි බවත්,රථගාල භූමියෙහි තිබෙන ඇසටු ගස් දෙක කැපීමට ඉක්මන් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

නාගරික සංවර්ධන සැලැස්ම අධ්‍යයනය කළ බවත්,මෙය දස අවුරුදු සැලැස්මක් බවත්,මෙහිදී ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් ඉඩම් හදුනා ගැනීමක් සිදු කිරීමක් සිදු කරන බවත්,වන්දි මත ඉඩම් පවරා ගැනීමටත්,මෙය ව්‍යාපෘතියක් ලෙස දස වසරක සැලැස්මක් හෙයින් දිගටම මෙය නොකරන බවත් අදියර කිහිපයකින් සිදු වන බවය.2026 වසරට මෙය ක්‍රියාත්මක වේදකියල සැක සහිත බවත්ය.මෙම අමාත්‍යාංශය මඟින් ලබා දෙන මුදල් වලින් යැපීම පිළබඳ කාරණයක් එන බවත්,මෙම සංවර්ධනය තුළින් ප්‍රජාවට සේවාවක් වන බවත් මෙම සංවර්ධනය වාණිජමය කටයුත්තකට යෙදවිය යුතු බවත්,මෙම ඉඩමට නඩුවක් පවතින බවත්ය.මෙම නඩුව ගොනු කර ඇත්තේ වෙරළුප වලව්ව,වෙරළුප,රත්නපුර පදිංචි රාජකරුණා සෙනෙවිරත්න දසානායක මුදියන්සේලාගේ චන්දන බැමිණියවත්ත බණ්ඩාර නැමති අයත්,විත්තිකරු ලෙස ලියනවඩු ආරච්චිගේ ජගත්සිර ලියනගේ හා දසනායක මුදියන්සේලාගේ ලලිත චන්ද්‍ර දසනායක යන අයය.නඩුව අධ්‍යයයනය කිරීමේදී පැහැදිළි වන්නේ මෙම පාර්ශවකරුවන් මෙහි අහලකවත් අයිතියක් නොමැති පුද්ගලයන් බවත්,1968 වර්ෂයේ රජය විසින් (පළාත් පාලන අමාත්‍යවරයා )ගැසට් පත්‍රයකින් අක්.01 රූ.03 පර්.05ක ඉඩමක් ගැසට් පත්‍රයකින් ගම් සභාවට ලබා දී ඇති බවත්,මෙම ගැසට් පත්‍රය වලංගුව පවතින බවත්,අවසාන ගම් සිතියමේද පැහැදිළිව සඳහන් බවත්,එම තොරතුර නොමැතිව නඩුව ගොනු කර ඇති බවත්,මෙම ඉඩම වලව්වකට අයිති සාම්ප්‍රදායික ඉඩමක් ලෙස සළකා නඩුව ගොනු කර ඇති බවයි. මෙහි සැබෑ අයිතිය ප්‍රාදේශීය සභාව සතු බවය.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් මුල් අවස්ථාවේ නඩුවට ඇතුලත් වීමට අවසර ඉල්ලා ඇතත් එය ප්‍රතික්ෂේප විය.ප්‍රතික්ෂේපවීමට හේතුව මුල් ලේඛන ඉදිරිපත් නොකර 1968 පළාත් පාලන අමාත්‍යවරයා විසින් ගම් සභාවට පවරන ගැසට් පත්‍රය හෝ අවසාන ගම් සිතියම නඩුවට ඉදිරිපත් නොකර 1986 චක්‍ර ලේඛ අංක 27 යටතේ ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියක් ඉදිරිපත් කිරීමය. මෙම පැවරීම පිළිගත නොහැකි බැවින් ප්‍රතික්ෂේප වී ඇත.ඉන් අනතුරුව නැවතත් පළාත් බද මහාධිකරණයේ අභියාචනාවක් ඉදිරිපත් කර ඇත.මෙය පළාත් බද මහාධිකරණය පිළිගෙන දීර්ඝ නඩු තීන්දුවකින් මෙහි අයිතිය පැහැදිළි බැවින් නඩු කටයුත්තට ඇතුල් වීමට අවසර ලබා දී ඇති බවත්ය.නඩුවට සාක්ෂි ඉදිරිපත් කළ විගස නඩුව අවසන් වන බවය.නමුත් මෙම පාර්ෂව කරුවන්ට කතා කිරීමේදී ඔවුන් නඩුව ඉල්ලා අස්කර ගැනීමට කැමති බව ප්‍රකාශ කළ බවත්,නඩුව අයින් කරනවා නම් උසාවියෙන් මෝෂමක් ගොනු කරන ලෙසය.අවමංගල්‍ය උත්සව ශාලාවක් ඇතුළුව ඉදිරිපත් කර ඇති යෝජනා 02ම පිළිගන්නා බවත් ,සංවර්ධනය සඳහා ක්‍රීඩා පිටියක් යෝජනා කර ඇතත්,මෙම මුදල් භාවිතා කර සංවර්ධනයක් සිදු නොකළහොත් අපට මෙම මුදල් අහිමි වන බවත්, එම නිසා සෑම දෙයක්ම සළකා බලා මුදල් දෙන අරමුණ සිතිය යුතුය.මේ සම්බන්ධයෙන් තීරණයක් ලබා දිය නොහැකිනම් මෙම කාරණය සාකච්ඡා කර ඉදිරි සභාවාරයේදී ඉදිරිපත් කල හැකි බවත් ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

ක්‍රීඩා පිටිය වෙනුවට රථගාල හා වෙළඳ සංකීර්ණය ඉදිකරනවානම් අප විරුද්ධ වන බවත්,නගරයේ ජනතාවගේ ඉල්ලීමක් ලෙස ක්‍රීඩා පිටියක් ඉදිකිරීමට යෝජනා වී ඇති බවයි.මේ යෝජනාව වෙනස් කරනවානම් සාකච්ඡා කළ යුතු බවත් අද දින මෙම යෝජනාව සම්මත කරනවානම් අපගේ විරෝධතාවය ප්‍රකාශ කර බෙදීමක් ඉල්ලන බවත්,එවිට ක්‍රීඩා පිටිය වෙනුවට වෙනත් සංවර්ධනයන් සිදු කිරීමට විරුද්ධ වූ බව ජනතාවට කිව හැකි බවත් නැතිනම් ඔවුනගෙන් දෝෂාරෝපනයක් එල්ල විය හැකි බැවින් මේ සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

ප්‍රාදේශීය සභාව සතුව සම්පත් නැති බවත්,ක්‍රීඩා පිටියක අවශ්‍යතාවයක් ඇති බවත්,රජයක් ලෙස විශේෂ අවස්ථාවකදී පාසල් වල පිට්ටනි ලබා ගැනීමට වැඩ පිළිවෙළක් සැකසිය යුතුය.නගරය මැද ඇති පොඩි ඉඩම් කොටස ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගත යුතුය පාලර් එක සැදීමට එකඟ බවත්,සංවර්ධනයන් කල් දම දමා යෑමෙන් අපට මෙම ලැබුණු මුදල් වලින් වැඩක් කිරීමට නොහැකි බවත්ය. යෝජනාව සම්මත කිරීම සුදුසු බවය,පාසල් බස්රථ නවතා තැබීම සඳහා රථ ගාල භූමිය අවශ්‍යයි.රථ ගාල ලෙස සංවර්ධනය කර අවශ්‍ය අවස්ථාවකදී පිට්ටනියක් ලෙස භාවිතා කළ හැකි බවත්, පිට්ටනියක් අවශ්‍ය නම් වතු සමාගමක් මඟින් ලබා ගැනීමට කටයුතු කළ හැකි බවත්,තවද බොරාල පිට්ටනිය දියුණු කරන බවත්,මෙම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසන ලදි.

ක්‍රීඩා පිටිය වෙනුවට වෙනත් ඉදිකිරීමක් සිදු කරනවානම් විරුද්ධ වන බවත් මේ සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලන බවත්,මෙම ඉඩම සුළු නගර සහා ක්‍රීඩා පිටිය නමින් නම් කර ඇති බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

බස් නැවතුම පිටුපස ඉඩමෙහි වෙළඳ සංකීර්ණය සාදන ලෙසත්,පොළ භූමිය අසළ ඉඩම ක්‍රීඩා පිටිය ලෙස සංවර්ධනය කරන ලෙසත්, අවශ්‍ය නම් සතිපොළ පවත්වන ස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකර පහත මහළ සතිපොළ ලෙස තබා ගෙන ඉහළ මහලවල් වෙළඳ සංකීර්ණයක් ඉදිකරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදි.

රථ ගාල ලෙස සංවර්ධනය කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

ආදාහනාගාර භූමියෙහි ආදාහනාගාර උත්සව ශාලාවක් ඉදි කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් උණුසුම් තත්වයක් උද්ගත වුණ බැවින් සභාපති තුමන් විසින් ගරු මහා සභාව විනාඩි 15කට කල් තබන ලදි.(පෙ.ව.11.15)

නැවත පෙ.ව.11.30ට ගරු සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

රථ ගාල හැදීමට විරුද්ධ නොවන බවත්,ඉඩකඩ අවහිර වන ලෙස ඉදිකිරීමක් නොකරන ලෙසත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා පවසන ලදි.

සංවර්ධන කටයුතු වලට විරුද්ධ නොමැති බවත්, නගරයේ බහුතර ජනතාවක් ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කරන ලෙස ඉල්ලීම් කර ඇති බවත්,මෙම යෝජනා පෞද්ගලික යෝජනා නොවන බවත්,මෙම භූමියෙහි ඉදිකිරීම් සිදු කිරීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් ප්‍රකාශ කරන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 04</u>**

පළාත් පාලන ආයතන වල ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා කාර්ය සාධනය මත පදනම් වූ ප්‍රාග්ධන ප්‍රධානය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සිදු කිරීම සුදුසු බව සභා සම්මත විය.

- ගල්ලෙපිට ආදාහනාගාරය පිහිටි භූමියෙහි අවමංගල්‍ය උත්සව ශාලාවක් ඉදි කිරීම
- පැල්මඩුල්ල සතිපොළ ආශ්‍රිත රථගාල සංවර්ධනය කිරීම.
- පාරිභෝගික ජනතාවට එකම ස්ථානයකදී පහසුවෙන් තමන්ට අවශ්‍ය සියලුම සේවාවන් ලබා ගැනීමට හැකි වෙළඳ සංකීර්ණයක් ස්ථාපිත කිරීම

05.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ගිවිසුම් මත මුරකරුවෙකු වන ඩබ්.ඩී.බී.වැලිගමගේ මයාගේ සේවා ගිවිසුම 2026.03.20 – 2027.03.19 දක්වා වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 05</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ගිවිසුම් මත මුරකරුවෙකු වන ඩබ්.ඩී.බී.වැලිගමගේ මයාගේ සේවා ගිවිසුම 2026.03.20 – 2027.03.19 දක්වා වසරකින් දීර්ඝ කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

06. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කෙටේතැන්න බොරාළ දක්වා දිවෙන මාර්ගයේ කොටසක් මැණික් කර්මාන්තය සඳහා වෙන්දේසි කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමිය වෙත යොමු කළ ලිපියට අනුව පිළිතුරු ලිපියක්

ACLG/06/01/08/03 හා 2026.02.18 දිනැති ලිපිය සභාවට ලැබුණි.එම ලිපිය ඉදිරි කටයුතු කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා එම ලිපිය ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

එකී ලිපිය පරිදි ප්‍රාදේශීය සභාව සතු කෙටේතැන්න බොරාල දක්වා දිවෙන මාර්ගයේ හොරගස්ඕවිට මාර්ග කොටසක මැණික් ඛනිජ පාෂාණ සහිත බවට අනුමාන කිරීම හේතුවෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හරහා ලන්සු කැඳවීම මගින් වෙන්දේසි කර මැණික් ගැරීමේ කටයුතු සිදු කිරීමෙන් පසුව මාර්ගයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති ඉල්ලීමට අනුව,

I. මැණික් ගැරීම සිදු කිරීම කළ පසු එයින් ඉවත් වන පස් ප්‍රමාණය යොදා ගනිමින් හාරනු ලබන වළවල් නැවත පස් පුරවා සකස් කිරීමටත්,අවශ්‍ය වුවහොත් පැති බැමි හෝ ගල් පිරවීම වැනි නිර්මිතයන් ඉදි කළ යුතු විය හැකි බැවින් එහිදී සභාවට යම් වැය බරක් දැරීමට සිදු විය හැකි බව නිරීක්ෂණය වේ.

II. ඒ අනුව එම කටයුතු සඳහා ලංසු කැඳවීමේදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් සභාවට ලබා දෙනු ලබන ලංසු අගයෙන් 40%ක කොටස තුල අවම වශයෙන් නැවත මාර්ගය පිළිසකර කර යථා තත්වයට පත් කරලීම සඳහා වැය විය හැකි මුදල හෝ අවම වශයෙන් ආවරණය කර ගත යුතුව ඇත.

III. එබැවින් මේ සම්බන්ධයෙන් වන වියදම් ඇස්තමේන්තුවක් සකස් කර ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලැබෙන 40%ක මුදල එම වියදම් ඇස්තමේන්තුවෙන් ආවරණය වන පරිදි කටයුතු කළ යුතු බවට වන සභා තීරණයක් සහිතව එම ඉල්ලීම අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරුණිකව උපදෙස් ලබා දෙමි.

මෙවැනි යෝජනා 03ක් ලැබී ඇති බැවින් මැණික් පිළිබඳ දැනුමැති අයගෙන් යුතු කමිටුවක් පත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

ප.ව.12.00 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා සභාවෙන් පිටවන ලදි.

ප.ව.12.00 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී මයුරි චතුරිකා පරණමාන්න මැතිතුමිය සභාවට පැමිනෙන ලදි.

**<u>තීරණ අංක 06</u>**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කෙටේතැන්න බොරාළ දක්වා දිවෙන මාර්ගයේ කොටසක් මැණික් කර්මාන්තය සඳහා වෙන්දේසි කිරීම යන යෝජනාව සම්බන්ධයෙන් අධ්‍යයනයක් කිරීමට මැණික් සම්බන්ධයෙන් දැනුමැති සභිකයින්ගෙන් සමන්විත පහත සඳහන් කමිටුව හරහා විධිමත් වාර්තාවක් ඉදිරි සභා වාරයට ඉදිරිපත් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.එම්.ඒ.අයි.එස්.අලගියවන්න මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා |
| ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය |

07. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් සවි කිරීම සඳහා 18 W පොට සහිත බල්බ් 500ක් මිළදී ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 07</u>**

විධිමත් ක්‍රමවේදය ඔස්සේ වීථි පහන් සඳහා 18 W පොට සහිත බල්බ් 500ක් මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

08.2026 වර්ෂය සඳහා පහත සඳහන් සාමාජිකයින් හා උපදේශන කාරක සභාව සඳහා සාමාජිකයින් පත් කිරීමට යෝජනා කරමි.

**මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - බී.තුෂාරි දමයන්ති මැතිතුමිය
5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදය කුමාර මැතිතුමා
බාහිර සාමාජිකයින්
6.ගුරු - කේ.බී.ෂෙල්ටන් ජයසිරි මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2026.01.14 දින පසුගිය සභා වාරයේදී පත් කළ සාමාජිකයන් පත්කළ ධනේශ් කුමරන් මැතිතුමා ඉල්ලා අස්වූයෙන් එම පුරප්පාඩුව සඳහා ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා අතුළත් කර ගන්නා බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

<u>**තීරණ අංක 08(I)**</u>

ඒ අනුව සංශෝදනයන් සහිතව 2026.01.14 දින මහා සභා තීරණ අංක 01(I) පත් කරගත් සාමාජිකයින් සමඟ නව සාමාජිකයින්ද ඇතුලත්ව සාමාජිකයින් 12 දෙනෙකුගෙන් හා බාහිර පුද්ගලයන් තිදෙනෙකුගෙන් යුත් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති -එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වි.නිර්මික දිපාල් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්.එම්.ශ්‍රීයානි වීරසේකර මැතිතුමිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
9. ගරු ප්‍රාදේශිය උප සභාපති - එච්.ජී.නලින් සේනක මාගම්මන මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - බී.තුෂාරි දමයන්ති මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදය කුමාර මැතිතුමා

බාහිර සාමාජිකයින්

13.ගුරු - ප්‍රේමරත්න කොඩිතුවක්කු මයා
14.විගණන නිලධාරී - පී.ඒ.ප්‍රභාත් ධර්මරත්න මයා
15.ගුරු - කේ.බී.ෂෙල්ටන් ජයසිරි මයා

**පරිසර හා පොදු පහසුකම් කාරක සභාව-**

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එච්.ජී.හපුතන්ත්‍රී මැතිතුමිය
2. ගරු ප්‍රාදේශීය මන්ත්‍රිනි - වෙරංජා කාමනී මැතිතුමි
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.පී.ඉදුමිණි කුලරත්න මැතිතුමිය
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත මැතිතුමා
5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එම්.සරත් උෂාන් මැතිතුමා
බාහිර සාමාජිකයින්
6.ගුරු - ලලිත් එස්.පත්මජීව මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ජී.හපුතන්ත්‍රී මැතිතුමිය වෙනුවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් මැතිතුමා ගෙන එන ලද යේජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>තීරණ අංක 08(II)</u>**

ඒ අනුව සංශෝධනයන් සහිතව 2026.01.14 දින මහා සභා තීරණ අංක 01(IV) පත් කරගත් සාමාජිකයින් සමඟ නව සාමාජිකයින්ද ඇතුලත්ව සාමාජිකයින් 12 දෙනෙකුගෙන් හා බාහිර පුද්ගලයන් තිදෙනෙකුගෙන් යුත් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිෂෝක් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
8. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා
9. ගරු ප්‍රාදේශිය මන්ත්‍රිනී - වෙරංජා කාමනී මැතිතුමිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.පී.ඉදුම්ණි කුලරත්න මැතිතුමිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.සුගත් ශාන්ත මැතිතුමා
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - එච්.එම්.සරත් උෂාන් මැතිතුමා

බාහිර සාමාජිකයින්

13. විශ්‍රාමික ගුරු - එච්.බස්නායක මයා
14. ගුරු - ඒ.වී.ලක්මාල් දයානන්ද මයා
15. ගුරු - ලලිත් එස්.පත්මජීව මයා

**කාර්මික සේවා කාරක සභාව -**

1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - එච්.ජී.හපුතන්ත්‍රී මැතිතුමිය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදය කුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.මොහාන් මංජුල මැතිතුමා
5. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා

බාහිර සාමාජිකයින්

6. ගරාජ් හිමිකරු - උපුල් නිශාන්ත මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

206.01.14 වන සභා වාරයේදී පත් කළ සාමාජිකයෙක් වූ ජෙගන් මෝහන් මැතිතුමා ඉල්ලා අස්වූයෙන් එම පුරප්පාඩුව සඳහා ඩී.එල්.යුරේෂ් ලියනගේ මැතිතුමා අතුළත් කර ගන්නා බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 08(III)</u>**

ඒ අනුව සංශෝධනයන් සහිතව 2026.01.14 දින මහා සභා තීරණ අංක 01(II) පත් කරගත් සාමාජිකයින් සමඟ නව සාමාජිකයින්ද ඇතුලත්ව සාමාජිකයින් 12 දෙනෙකුගෙන් හා බාහිර පුද්ගලයන් තිදෙනෙකුගෙන් යුත් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ කාර්මික සේවා කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඉන්දික කුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එච්.ජී.හපුතන්ත්‍රී මැතිතුමිය

9. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.ඉන්දික උදය කුමාර මැතිතුමා
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.මොහාන් මංජුල මැතිතුමා
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ආර්.ධනේශ් කුමරන් මැතිතුමා

බාහිර සාමාජිකයින්

13.විශ්‍රාමික ඉංජිනේරු - රංජිත් කරුණාතිලක මයා
14.විශ්‍රාමික කාර්මික නිලධාරී - හේමන්ත දංගහදෙණිය මයා
15.ගරාජ් හිමිකරු - උපුල් නිශාන්ත මයා

**නිවාස සංවර්ධන කාරක සභාව -**

1.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - එම්.සුලාරි සඳරේඛා මැතිතුමිය
2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා
4.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය
5.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - ආර්.පුවනේෂ්වරී මැතිතුමිය

බාහිර සාමාජිකයින්

6. ගුරු - ජයරත්න බණ්ඩාර මයා

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පසුගිය සභා වාරයේදී සාමාජිකයන් පත්කළ ජෙගන් මෝහන් මැතිතුමා ඉල්ලා අස්වූයෙන් එම පුරප්පාඩුව සඳහා ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා අතුළත් කර ගන්නා බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

**<u>තීරණ අංක 08(IV)</u>**

ඒ අනුව සංශෝධනයන් සහිතව 2026.01.14 දින මහා සභා තීරණ අංක 01(III) පත් කරගත් සාමාජිකයින් සමඟ නව සාමාජිකයින්ද ඇතුලත්ව සාමාජිකයින් 12 දෙනෙකුගෙන් හා බාහිර පුද්ගලයන් තිදෙනෙකුගෙන් යුත් පැල්මඩුල්ල ප්‍රාදේශිය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර් තිෂෝක් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඒ.ඉසුරු සම්පත් අලගියවන්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.වසන්ත කුමාරසිරි මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්.එම්.ශ්‍රියානි වීරසේකර මැතිතුමිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.සුලාරි සඳරේඛා මැතිතුමිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා
10. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී - ඩබ්.ජෙගන් මෝහන් මැතිතුමා
11. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය
12. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී - ආර්.පුවනේෂ්වරී මැතිතුමිය

බාහිර සාමාජිකයින්

13.විශ්‍රාමික කළමනාකරණ සේවා නිලධාරී - ආර්.එම්.රංජනී සිරිසේන මිය
14.විශ්‍රාමික නිවාස සංවර්ධන නිලධාරී - ඩබ්.එච්.කේ.ජයවර්ධන මයා
15. ගුරු - ජයරත්න බණ්ඩාර මයා

උපදේශන කාරක සභාව සඳහා පහත සඳහන් සාමාජිකයින් පත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා ස්ථිර කරන ලදි.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය

ඒ අනුව සංශෝධනයන් සහිතව 2026.01.14 දින මහා සභා තීරණ අංක 01(V) පත් කරගත් සාමාජිකයින් සමඟ නව සාමාජිකයින්ද ඇතුලත්ව පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ උපදේශන කාරක සභාවේ සාමාජිකයින් ලෙස පහත සඳහන් සභිකයින් හා බාහිර පුද්ගලයින් පත් කිරීම සුදුසු බවට සභා සම්මත විය.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -බී.නිශාන්ත කුමාර බුද්ධාරච්චි මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -කේ.ඩී.රුවන් චානක පියරත්න මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී -ටී.ශ්‍රියානි ජානකී පීරිස් මැතිතුමිය
10. - රංජිත් කරුණාතිලක මයා
11. - ඇන්ටන් මයා
12. - ටී.කේ.එස්.සුරේෂ් මයා
13. -පාලිත කොතලාවල මයා
14. ගරු - නිශාන්ත ලේකම්ගේ මයා

09.2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති වල බිල්පත් ආවරණ අනුමැතිය යටතේ ගෙවන ලදි.එම ගෙවීම අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

- ප්‍රධාන අමාත්‍යාංශ අරමුදලින් වටවල ඉමේ කැලේ මාර්ගය සංවර්ධනය කිරීම රු.1,276,606.84 -එකමුතු අවමංගල්‍යාධාර සුභ සාධන සමිතිය,කිරිවන්දල,පැල්මඩුල්ල.
- පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ අරමුදලින් නීලගම සමඟි මාවත සංවර්ධනය කිරීම රු.1,668,616.36 - සිතමු අරුණළු කාන්තා ගොවි සංවිධානය,නීලගම,හේන්යාය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 09**</u>

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති වල බිල්පත් ආවරණ අනුමැතිය යටතේ ගෙවීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

- ප්‍රධාන අමාත්‍යාංශ අරමුදලින් වටවල ඉමේ කැලේ මාර්ගය සංවර්ධනය කිරීම රු.1,276,606.84 -එකමුතු අවමංගල්‍යාධාර සුභ සාධන සමිතිය,කිරිවන්දල,පැල්මඩුල්ල.
- පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් සංචාරක,ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ අරමුදලින් නීලගම සමඟි මාවත සංවර්ධනය කිරීම රු.1,668,616.36 - සිතමු අරුණළු කාන්තා ගොවි සංවිධානය,නීලගම,හේන්යාය.

10.2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති වල බිල්පත් මුදල් නිදහස් කිරීම සුදුසු බව යෝජනා කරමි.

- මිදලන දෙබුන්වල ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම - රු.1,004,959.22
- බුලත්වැල්ගොඩ පාර සංවර්ධනය කිරීම - රු.651,191.33

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>**තීරණ අංක 10**</u>

2025 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පහත ව්‍යාපෘති වල බිල්පත් මුදල් නිදහස් කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

- මිදලන දෙබුන්වල ගම්මානයට යන මාර්ගය සංවර්ධනය කිරීම - රු.1,004,959.22
- බුලත්වැල්ගොඩ පාර සංවර්ධනය කිරීම - රු.651,191.33

සභාව සඳහා සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී මෙම කරුණු කාරණා අවබෝධයෙන් යුතුව යෝජනා ඉදිරිපත් කරන ලෙසත්,එනම් 2026 වර්ෂය සඳහා අයවැයෙන් වෙන් කරන ලද රු.ලක්ෂ 23ක් භෞතික සංවර්ධනයන් වෙනුවෙන් වෙන් කර ඇති බැවින්, ප්‍රාදේශීය සභා පනතේ සඳහන් මූඛ්‍ය සේවාවන් සම්බන්ධයෙන් අවධානය යොමු කර යෝජනා ඉදිරිපත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා ගරු සභාවෙන් ඉල්ලා සිටින ලදි.

**II.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.සරත් උෂාන් මහානාම මැතිතුමාගේ යෝජනා.**

11.එම්.ගුණසේන මහතාගේ කඩය අසළින් ප්‍රජා ජල යෝජනාවට යන මාර්ගයේ අඩි 100ක ප්‍රමාණයක් දක්වා කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 11**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

12.හකමුව වතුකර මාර්ගයේ දෙල්ගහ ලයිම අසළ සිට වතුර යෝජනා ක්‍රමය දක්වා පාර කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.මොහාන් මංජුල මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 12**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

මෙම සංවර්ධන යෝජනා ඉදිරිපත් කරනු ලබන්නේ සභාවෙන්ම කිරීමට නොව සභාව හරහා ඇස්තමේන්තු සකස් කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම තුළින් එම ආයතනයේ සංවර්ධනයන් සිදු කිරීමේදී අපගේ යෝජනා වලට අවස්ථාවක් ලැබිය හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**III.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඩී.ආර්.සී.පියරත්න මැතිතුමාගේ යෝජනා.**

13.අලුපොත ගංගාරාම පන්සල පාර සහ පන්සල් භූමිය විදුලි බුබුළු සහ විදුලි කුළුණු සවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 13**

නව විදුලි ලාම්පු සවි කිරීම සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ සබර/රපු/ලි5/වී.ලාම්පු/2023 හා 2023.04.17 දිනැති ලිපිය මඟින් නව වීථි පහන් සවි නොකරන ලෙස දන්වා ඇති බැවින් නව වීථි පහන් සවි කිරීම සිදු නොකිරීමටත්,අත්‍යවශ්‍ය ස්ථාන හඳුනාගෙන ලංකා විදුලි බල මණ්ඩලයන් ඉල්ලීමක් සිදු කිරීමටත්,අවශ්‍ය ස්ථාන වල වීථි පහන් මිලදී ගැනීමෙන් පසු සවි කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

14.අලුපොත ක්‍රීඩා පිටිය අසළ මාර්ගය (කැඩී ගිය කොටස) කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 14**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

15.කරවිට මාර්ගයේ සිට පැලිමෝදර දක්වා මාර්ගයේ ඉතිරි කොටස බැකෝ යන්ත්‍ර යොදා පස් කපා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 15**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

16.අගුරුගල්හේන නව මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 16**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

17.අගුරුගල්හේන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 17**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**IV.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.චන්ද්‍රලාල් ජයරත්න මැතිතුමාගේ යෝජනා.**

18.තණ කොළ කපා ඉවත් කිරීම වෙනුවට වල්නාශක ලාභදායි ක්‍රමයක් වේ.එම නිසා වල්නාශක(ග්ලයිෆොසේට්))භාවිතය සුදුසු බව යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එල්.ඉන්දික ගයාන් ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 18**

ඉහත යෝජනාව පරිසර හා පොදු පහසුකම් කමිටුව වෙත ඉදිරිපත් කර වාර්තාවක් ලබා ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**V.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එෆ්.ජගත් සේනාරත්න මැතිතුමාගේ යෝජනා.**

19.171 දෙනවක පාතකඩ වසමේ එගොඩවත්ත ප්‍රදේශයට යන මාර්ගය ඉදි කළද එයට බෝක්කුවක් සෑදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 19**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

20.සන්නස්ගම නව ගම්මානයේ කොන්ක්‍රීට් නොකළ කොටස කොන්ක්‍රීට් කර කාණු පද්ධතිය පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 20**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

21.කෙවිටියගලවත්ත ප්‍රධාන මාර්ගයේ පහළ කොටස සෑදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 21**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

22.සන්නස්ගම පාලුගම්පල ජන උදා ගම්මානයේ මාර්ගයේ ඉහළ කොටස අලුත්වැඩියා කිරීමට සැදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 22**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

23.පාලුගම්පල ගම්මානයේ ක්‍රීඩා පිටිය අසළින් ඇති මීටර් 300ක් පමණ මාර්ගය පිළිසකර කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 23**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සභා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සභා සම්මත විය.

**VI.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමාගේ යෝජනා.**

24.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේපවුල් වල මරණයක් සිදු වූ විට ආදාහනාගාරයේ අවසන් කටයුතු සිදු කිරීමට අවශ්‍ය වුවහොත් එම සේවාව නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජු ඩයස් වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් අයවැයෙන් මුදල් වෙන් කර ඇතත්,අපට ලබා දෙන ඉන්ධන දීමනා,ගමන් වියදම් දීමනා මන්ත්‍රීවරුන් ලබා නොගන්නා බැවින් මෙම වර්ෂය සඳහා එම මුදල් ලබා ගෙන එම සේවාව සපයා දෙන ලෙසත් කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන එම මුදලින් කොටසක් වෙන් කරවාගෙන මෙම සේවාව අඩු ආදායම්ලාභී පවුල්වෙත ලබා දීමට අවස්ථාවක් සළසා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 24**

සභාවේ මූල්‍ය ප්‍රතිපාදන තත්වය සළකා බලා දැනට මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නොමැති බව සභා සම්මත විය.

**VII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත කුමාර කුඩාවත්ත මැතිතුමාගේ යෝජනා.**

25. වාරිගම හා සකිකන්ද පිවිසුම් මාර්ගයෙහි අවහිරව ඇති කාණු පද්ධති සභාවේ බැකෝ යන්ත්‍රය යොදා පිළිසකර කිරීමට යෝජනා කරමි

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 25**

ස්ථානීය පරීක්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

26.2025.10.15 දිනැති අරුණ ගොවි සංවිධානය කළ ඉල්ලීමට අනුව 2026.02.16 කළ නිරීක්ෂණ නිගමනය පරිදී දැනට ඇස්තමේන්තු සකසා ඇති උඩතුල ප්‍රධාන පාරේ බෝක්කුව සඳහා සභා ප්‍රතිපාදන වෙන් කරන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එල්.යුරේෂ් පුෂ්පකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 26**

ප්‍රතිපාදන තත්වය සළකා බලා ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

**VIII.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.පුෂ්පකුමාර ධනසේකර මැතිතුමාගේ යෝජනා.**

27. උඩදළුව දමිළ වතු නිවාස වෙත ජලය ලබා ගන්නා ජල නළ මාර්ගය එම කන්දෙඅරඹ අසළ මාර්ගයේම ඉහළ කොටසට සම්බන්ධ කිරීම සඳහා අවශ්‍යය බට ප්‍රමාණය ප්‍රාදේශිය සභාව ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක27**

ස්ථානීය පරික්ෂාවක් සිදු කර ලැබෙන නිර්දේශ හා ප්‍රතිපාදන තත්වය සළකා බලා ඉදිරිකටයුතු සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

28.බැරැණුඩුව වසම ආවරණය වන පරිදී ප්‍රාදේශිය සභාවේ කසළ එකතු කිරීමේ රථය සතියකට වරක් හෝ ධාවනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 28**

ඉදිරියේදී බැරැණුඩුව වසම ආවරණය වන පරිදී ප්‍රාදේශිය සභාවේ කසළ එකතු කිරීමේ රථය සතියකට වරක් හෝ ධාවනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

29.බන්දුල මලය කෘෂි මාර්ගය දැනට අවසන්ව ඇති ස්ථානයේ සිට මී.300ක් පමණ ඉදිරියට බැකෝ යන්ත්‍රය යොදා අලුතෙන් මාර්ගය සකස් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 29**

ස්ථානීය පරික්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

30.බැරුණ්ඩුව 93 කොටස ගම්මානයේ පිවිසුම් මාර්ගයේ අබලංව අතිශය අනතුරුදායක ලෙස පවතින බෝක්කුව කඩිනමින් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 30**

ස්ථානීය පරික්ෂණයක් සිදු කර ලැබෙන නිර්දේශ මත සහා වියදමෙන් සිදු කිරීමට ප්‍රතිපාදන ඇත්නම් සිදු කිරීමටත්,එසේ හැකියාවක් නොමැති සංවර්ධනයන් අදාළ ආයතන වෙත යොමු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

31.බුදුලෙන පෙර පාසල ප්‍රාදේශිය සභාව යටතේ පාලනය වන පෙර පාසලක් බවට පත් කර දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඉන්දික කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 31**

බුදුලෙන පෙර පාසල ප්‍රාදේශිය සභාව යටතේ පාලනය වන පෙර පාසලක් බවට පත් කර දරුවන්ට පෙර පාසල් අධ්‍යාපනය නොමිලේ ලබා දීම සම්බන්ධයෙන් ප.පා.කො.හරහා උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ඒකමතිකව සහා සම්මත විය.

පහත සඳහන් යෝජනා සම්බන්ධයෙන් කඩිනමින් තීරණයක් ලබා ගැනීමට අවශ්‍ය හෙයින් හදිසි යෝජනා ලෙස ඉදිරිපත්

කිරීම සඳහා ගරු සභාවේ අවසරය මත යෝජනා ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ ධර්මසිරි මැතිතුමා ඉදිරිපත් කරන ලදි.

**හදිසි යෝජනා**

**ගරු සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමාගේ යෝජනා.**

01.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 1984 අංක 37 දරණ විනෝද බදු (සංශෝධිත)පනතින් සංශෝධිත 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද ප්‍රසංග වලට ඇතුළත් වීමේදී ගෙවනු ලබන මුදලින් 15%ක විනෝද බද්දක් ඉහත කී 1984 අංක 37 දරණ විනෝද බදු (සංශෝධිත)පනතින් සංශෝධිත 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2(1) උප වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පනවා අය කර ගත යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ශ්‍රියානි වීරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 32**

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 1984 අංක 37 දරණ විනෝද බදු (සංශෝධිත)පනතින් සංශෝධිත 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ ප්‍රකාශිත විනෝද ප්‍රසංග වලට ඇතුළත් වීමේදී ගෙවනු ලබන මුදලින් 15%ක විනෝද බද්දක් ඉහත කී 1984 අංක 37 දරණ විනෝද බදු (සංශෝධිත)පනතින් සංශෝධිත 1946 අංක 12 දරණ විනෝද බදු ආඥා පනතේ 2(1) උප වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පනවා අය කර ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

02.ප්‍රධාන කාර්යාලයේ ජලය සැපයීම සඳහා ළිඳ වෙත යොදා ඇති ජල මෝටරය 2026.03.03 වන දින අක්‍රීය වී ඇති හෙයින්,ජී.ජී.ඉලෙක්ට්‍රොනික් ඇන්ඩ් මෝටර්ස් ,ගැටන්ගම,රත්නපුර ආයතනයෙන් අලුත්වැඩියාව සඳහා රු.52,000.00ක ඇස්තමේන්තුවක් ලබා දී ඇත.දැනට පවතින හෝස්පවර් 2 හා අඟල් 2 ජල පිටවුම සහිත ජල මෝටරයක මිළ ගණන් කැඳවා ඇත. මේ සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**තීරණ අංක 33**

මේ සම්බන්ධයෙන් විදුලි ඉංජිනේරු වරයෙකුගෙන නිර්දේශ ලබා ගැනීමටත්, හෝස්පවර් 1 හා අඟල් 1 ජල පිටවුම සහිත ගිල්වන ජල මෝටරයක පිරිවිතර ලබා ගෙන විධිමත් ක්‍රමවේදය ඔස්සේ මිලදී ගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

03.කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත දිනපතා කසළ එකතු කිරීමේ රථ ගමන් තිරීමට අවශ්‍ය බැවින් මාර්ගයේ කොටසක් පමණක් කොන්ක්‍රීට් කිරීම සිදු කර ඉතිරි කොටස රථ ගමනාගමනයට ඉඩ ඉතිරි කර ඇත.පසුගිය වැසි කාලයේ වැඩ ඉතිරි කොටසෙහි එක් ස්ථානයක කාණුව ඉවුර සෝදා ගෙන ගොස් ඇත.ඉවුර මාර්ගය ආසන්නව පවතින බැවින් එම ස්ථානයේ පැති බැම්මක් සහා අරමුදලින් සකස් කිරීම සඳහා සුදුසු තීරණයක් ලබා ගැනීමට ගරු සභාවට ඉදිරිපත් කරමි.(ඇස්තමේන්තු මුදල රු.250,000.00කි)

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.වී.නිර්මික දීපාල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉදිරියේදී මෙවැනි යෝජනා කාර්මික කමිටුවට ඉදිරිපත් කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඒ.අයි.එස්අලගියවන්න මැතිතුමා පවසන ලදි.

**තීරණ අංක 34**

මෙම පැති බැම්ම සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

04.පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවට පොදු වෙළඳපළ 14 මාළු කඩ කාමරය සම්බන්ධයෙන් 2026 පෙබරවාරි 11 වන දින මහා සභා තීරණ අංක 13 යටතේ ලබා ගත් තීරණය සංශෝධනය කරමින්,සිව්වන ලංසු කරු හා පස්වන ලංසු කරුවන් විසින් උක්ත කඩ කාමරය ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපි ඉදිරිපත් කර ඇති හෙයින් පොදු වෙළඳපළ 14 මාළු කඩ කාමරය සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ගයාන් පුෂ්පකුමාර මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.12.30)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.පුවනේෂ්වරී මැතිතුමිය ප.ව.12.00ට සභාවෙන් පිටවන ලදි.

2026 වසරට අංක 14 මාළු කඩ කාමරය ටෙන්ඩර් කළත්,තක්සේරුව අනුව අවම මුදල ලෙස රු.420,000.00ක් තක්සේරු කළ හෙයින් ගැනුම්කරුවන් 05 දෙනෙකු ඉදිරිපත් විය.මෙහි නීතිමය පැතිකඩ ලෙස ටෙන්ඩරයක් ඉදිරිපත් කළ පසු වැඩිම ගැනුම්කරුවට ටෙන්ඩරය ලබා ගැනීමට දන්වන අතර ඔහු කිසියම් හෙයකින් එය ප්‍රතික්ෂේප කළහොත් තක්සේරු කළ මුදලට වැඩියෙන් ටෙන්ඩර් කළ ගැනුම්කරුවන්ගෙන් පිළිවෙළින් විමසිය යුතුය. මෙහිදී අතපසු වීමකින් පළමු හා දෙවන ගැණුම්කරුවන්ගෙන් පමණක් විමසා නැවත එම කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා සභා යෝජනාවක් ඉදිරිපත් වී තිබේ.මෙහි ගැටළුකාරී තත්වයක් තිබේ.මන්ද 03 වෙනි ගැණුම්කරුවා මේ වන විටත් මේ කඩ කාමරය ගැනීම සම්බන්ධයෙන් නිශ්චිත පිළිතුරක් ලබා දී ඇත, 04 වෙනි සහ 05වෙනි ගැනුම්කරුවන් කඩ කාමරය ලබා ගන්නා බවට ලිපි ඉදිරිපත් කර ඇත.එම තත්වය මත ඊළඟ නීත්‍යානුකූල පියවර ලෙස ඉන් අනතුරුව ඉදිරිපත් කර ඇති වැඩි ටෙන්ඩරයට ලබා දිය යුතුය.නැවත ටෙන්ඩර් කිරීමට සභා තීරණයක් ගත් හෙයින් නැවත ටෙන්ඩර් කිරීමේදී රු.625,000.00 මුදලට අඩු මුදලක් ටෙන්ඩර් වුවහොත් නීතිමය ගැටළුවක් ඇති විය හැකිය.තවද අනෙක් ගැනුම්කරුවන් ඔවුන්ට ටෙන්ඩරය ලබා නොදීම පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කළ හොත් මෙය ගැටළුවකි. ඒ අනුව මෙය නැවත ටෙන්ඩර් කිරීම ගැටළු සහගත වේ.මෙය නැවත සභාව විසින් ටෙන්ඩර් කිරීමට තීරණය කළ හොත් අධිභාරයක් ඇති විය හැකි බව ලේකම් ආර්.කේ.කපිල ජගත් ගුණතිලක මහතා විසින් පවසන ලදි.

තවදුරටත් පැහැදිළි කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තුමා දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කර ගෙන දූරකතන සංවාදය ඇසීමට සළස්වා ගැටළු නිරාකරණය කර ගැනීමට අවස්ථාව සළසා දෙන ලදි.ලේකම්තුමා පැවසූ කාරණාම එතුමා පවසන ලදි.

කාරක සභාව ගරු මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බව බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා ස්ථිර කරන ලදි.(ප.ව.12.50)

**<u>තීරණ අංක 35</u>**

පොදු වෙළඳපළ 14 මාළු කඩ කාමරය සම්බන්ධයෙන් විධිමත් වාර්තාවක් ප්‍රසම්පාදන කමිටුව හරහා ලබා ගෙන ඉදිරි සභා වාරයට යොමු කර තීරණයක් ලබා ගැනීම සුදුසු බවට ඒමතිකව සභා සම්මත විය.

ආදාහනාගාර භූමියෙහි පතල් දෝණා සම්බන්ධයෙන්මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකරුවෙකු සමඟ සාකච්ඡාවක් සිදු කර නිරීක්ෂණයක් සිදු කළ අතර ,පැල්මඩුල්ල කලාපය භාර ක්‍රියාත්මක නිලධාරී සමඟ ගොස් ආදහනාගාර භූමිය ආසන්නයේ පතල් 03ක් පවතින බවත් එම පතල් වලට බැස බැලූ බවත් පතල් තුනෙහි ආදාහනාගාර ඉඩමට මතුපිටින් දුර මැන බැලන ලදි.ඒ අනුව 1 පතල ඉඩමට ආසන්නයේ ඇති බවත්,ඉඩමට ඇතුල් නොවී එක්තරා ස්ථානයක නැවතී ඇති බවත්,දෙවන පතලය මීටර් 100ක් පමණ ඈතින් පිහිටා ඇති බැවින් එය තර්ජනයක් නොවන අතර තෙවන පතලය බැලීමේදී දැනට ඉඩමට අතුලත් වී නොමැති බවත් ආදාහනාගාර මායිමට අඩි 05ක ප්‍රමාණයකින් නැවතී ඇති බවය.මෙවැනි නිරීක්ෂන ඉදිරියේදිත් සිදු කරන බව ගරු ප්‍රාදේශීය සභා සභාපති එම්.ජී.ඒ.ධර්මසිරි මාණිපුර මැතිතුමා පවසන ලදි.

## 07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

2026.03.30 පැවති කාර්මික හා සේවා කමිටු රැස්වීම් වාර්තාව ,2026.02.06 පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව, 2026.02.20 පැවති පරිසර හා පොදු පහසුකම් කමිටු වාර්තාව සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ.සම්පත් සිරිශාන්ත මැතිතුමා ප.ව.1.35ට සභාවෙන් පිටවන ලදි.

## 08.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

2026.01.01 සිට 2026.01.31 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සභා ගත කරන ලදි.

PEL/PS/ACC09 හා 2026.02.250 දිනැතිය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ඉදිරිපත් කර ඇති විගණන වාර්තාව සභාගත කරන ලදි.

**වෙනත් කරුණු**

- **සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**

*ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වෙරංජා කාමනී විජේරත්න මැතිතුමා*

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ විපක්ෂයේ මන්ත්‍රීවරියක් වශයෙන් ජනවාරි මාසයේ සිට මෙම සභාවේ සේවයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබී තියෙනවා.මට මෙම අවස්ථාව හිමි වුනේ මාගේ සහෝදර මන්ත්‍රීවරියක් වූ සචිනි සෙව්වන්දි මහත්මිය ඉල්ලා අස්වීම නිසා පුරප්පාඩු වූ මන්ත්‍රීධූරයට සජබ රත්නපුර දිස්ත්‍රික් සංවිධායක සමිත ආටිගල මහතා විසින් මාගේ නම යෝජනා කළ නිසා එතුමාටද මාගේ හදපිරි ස්තූතිය පුදකරන අතර අද දින සිට මෙම සභාවේ වැඩකටයුතු වලට සභාපතිතුමා

ඇතුළු සියලු දෙනාටම මාගේ උපරිම සහයෝගය දක්වන අතර සමගියෙන් සහයෝගයෙන් සහෝදරත්වයෙන් ඔබ සියලු දෙනා සමඟ කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා.ඒ වාගේම නවක මන්ත්‍රීවරියක් වන මා හට ඔබ සැමගේ සහයෝගය ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මාගේ කතාව අවසන් කරනවා.

- **සභාපතිතුමාගේ ස්තූති කිරීම.**

අද දින සභාවට පැමිණ සිටින ගරු විපක්ෂනායකතුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමාගේ ස්තූති කතාව අවසන් කරන ලදී.

- ප.ව.1.50ට පමණ සභාවේ කටයුතු අවසන් විය.
- ගරු ප්‍රාදේශීය සභා ................................................................ මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ..................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2026-04-07 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව